# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 2 ශ්‍රේණිය - පරිසරය( සැප්තැම්බර් -4 සතිය)

**13 තේමාව - එළිය සමඟ සෙල්ලම්.**

**දුවේ පුතේ, අද අපි මුං ඇට සිටවමු.**

- සමාන ප්‍රමාණයේ මල් බඳුන් දෙකක් ගෙන එම බඳුන් දෙකෙහි මුං ඇට බීජ පැළ කරන්න.
- දිනපතා ජලය දමමින් මුං ඇට පැළ වන තෙක් සුදුසු ස්ථානයක තබන්න.
- මුං බීජ පැළවූ පසු ඉන් එකක් හිරු එළිය ඉහළින් ලැබෙන ස්ථානයක තබන්න.
- අනෙක් බඳුන පෙට්ටියක බහා හිරු එළිය එක් පැත්තකින් පමණක් ලැබෙන සේ පෙට්ටියේ පැත්තකින් කවුළුවක් සකස් කර තබන්න. (වැඩිහිටියෙකුගේ උදවු ලබාගන්න.)

දුවේ පුතේ, මේ පැළවලට කුමක් විය හැකිද?
දින කිහිපයකට පසු බැලූ විට මුං පැලවලට කුමක් සිදු වී තිබිය හැකි ද?

- දුවේ පුතේ, දින කිහිපයකට පසු මුං පැළ නිරීක්ෂණය කරන්න.
- දින කිහිපයකට පෙර ඔබ අනුමාන කළදේ සිදුවී ඇත් ද? / නැද්ද?
- ඔබ දැන් නිරීක්ෂණය කළ මුං පැළ බඳුන් දෙකම චිත්‍රයට නගන්න.
- අප්පච්චි සමඟ ගෙවත්තෙහි චාරිකාවක යෙදෙන්න. එහිදී ශාක හිරු එළිය දිශාවට නැමී තිබේදැයි සොයා බලා සතුටු වන්න.
- ගෙවත්තේ දී හිරු එළිය  දිශාවට නැමී තිබුණු ශාක චිත්‍රයට නගන්න.

❖ E nanapiyasa 2 ශ්‍රේණිය පරිසරය -13 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.